# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO – 1362/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 30/10/2023 පැය 2050

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරීන්ට පහරදී රාජකාරියට බාධා කරමින් පොලිස් යතුරුපැදිය කොල්ලකෑමක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.**

කැබිතිගොල්ලෑව පොලිස් වසමේ කුරුලුගම ග්‍රාමයේ පදිංචිව සිටි පුද්ගලයෙකු සර්පයෙකු දෂ්ඨකර මියයාම නිසා ඔහු වෙනුවෙන් සිදු කරන සත්දින ධර්ම දේශනාව සහ දානමය පිංකම සඳහා එම ප්‍රදේශයේ පිහිටි කුරුලුගම පුරාණ රජමහා විහාරස්ථානයේ වැඩ වාසය කරන ස්වාමීන් වහන්සේ නමකට ආරාධනා කර ඇත.

උන්වහන්සේ එම ආරාධනාව භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති අතර රුපියල් 45,000/- ක මුදලක් ලබා දෙනනේ නම් පැමිණිය හැකි බවත්, එසේ නොමැති නම් දායක සභාව සමඟ කතා කරගන්නා ලෙසටත් පවසා ඇත. අනතුරුව දායක සභාවේ සභාපතිවරයා විසින් දායක සභාවට ඇතුළුවීමේ ගාස්තු ලෙස රුපියල් 1,500/- ක්ද, නියමිත පරිදි දාන වේල් 04 ක් ලබා නොදීම වෙනුවෙන් රුපියල් 10,000/- ක්ද, මාසික ගාස්තු සඳහා රුපියල් 400/- ක් ද, කොටස් මුදල් ලෙස රුපියල් 1000/- ක් ද, ශ්‍රමදාන සඳහා නොපැමිණීම වෙනුවෙන් රුපියල් 3,000/- ක් ද, ලෙස ගණනය කොට රුපියල් 15,900/- ක අවම මුදලක් අවශ්‍ය බව දැනුම්දී ඇත.

නිවැසියන් විසින් එය ප්‍රතික්ෂේප කර ප්‍රදේශයේ ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ නමක් නියමිත දිනට ධර්ම දේශනය සඳහා වැඩම වීමට කටයුතු කර ඇති අතර, එම අවස්ථාවේ කුරුලුගම පුරාණ රජමහා විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ සහ දායක පිරිස පැමිණ ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා කිරීමට බාධා කර ඉවත්ව යන ලෙසට දැනුම් දී ඇත.

කැබිතිගොල්ලෑව පොලිස් ස්ථානයට මේ පිළිබඳව ලද තොරතුරු මත පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වහාම අදාල නිවස වෙත පිටත් කර යවා තිබුණද එම නිලධාරීන්ට තත්ත්වය පාලනය කර ගැනීමට නොහැකි වීම මත ස්ථානාධිපති ඇතුළු තවත් නිලධාරීන් කණ්ඩායමක් එම නිවස වෙත ගොස් ඇත. ධර්ම දේශනාව සඳහා වැඩමවා සිටි ස්වාමීන් වහන්සේට පැමිණ සිටි පුරාණ රජමහා විහාරස්ථානයේ හිමි නම සහ දායක පිරිස තර්ජනය කිරීම හේතුවෙන්, උන්වහන්සේ එම ස්ථානයෙන් ආරක්ෂා සහිතව පිටත් කර යැවීමට නිලධාරීන් විසින් උත්සාහ

කලද රැස්ව සිටි කුරුලුගම පුරාණ රජමහා විහාරස්ථානයේ හිමිනම ඇතුළු පිරිස කලහකාරී ලෙස හැසිරෙමින් ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ නමට පහර දීමට ක්‍රියා කර ඇති අතර එය වැළැක්වීමට කටයුතු කල පොලිස් නිලධාරීන්ට පහරදීමක් සිදුකර ඇත. එම අවස්ථාවේ පොලිස් නිලධාරියෙකු පැමිණි පොලිස් යතුරුපැදියක්ද පැහැර ගැනීමක් සිදුකර තිබූ අතර, පසුව එම යතුරුපැදිය කුරුලුගම පුරාණ රජමහා විහාරස්ථානයේ ආවාස ගෙය තුල තිබියදී සොයා ගැනීමට හැකි වී ඇත.

මෙම සිදු වීමෙන් තුවාල ලැබූ ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ රෝහල් ගත කර ඇති අතර පොලිස් නිලධාරීන් දෙදෙනෙක්ද රෝහල් ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර කුරුලුගම පුරාණ රජමහා විහාරස්ථානයේ ස්වාමීන්වහන්සේ අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2023.10.31 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. 2023.10.30 වන අද දින අත්අඩංගුවට ගත් සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු 2023.10.31 වන දින ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මේ පිළිබඳව කැබිතිගොල්ලෑව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**